"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி" கட்டடம் ,32, ஸ்ரீமத் மார்க்கஸ் பெர்னாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi Mandiraya", 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 2698409
ෆැක්ස් / பெக்ஸ் / Fax - 2694667
ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி / General Telephone 2682868, 2682869, 2682870

මගේ අංකය / எனது இல. / My No. } CSO/FIN/2/3/2(111) ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2018.01. 25

**බස්නාහිර පළාත්**

**ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2018**

**බස්නාහිර පළාතේ,**
**සියළුම ලේකම්වරුන්,**
**පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතන වල**
**සභාපතිවරුන් වෙත.**

**පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතනවල**
**කාර්ය මණ්ඩලට 2017 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීම.**

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2017.12.11 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 03/2017හි දැක්වෙන උපදෙස් සැලකිල්ලට ගෙන පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතනවල කාර්ය මණ්ඩලයට 2017 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

01. ප්‍රසාද දීමනා ගෙවීම.

2017 වර්ෂය සඳහා පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතනවල කාර්ය මණ්ඩලට පහත පරිදි ප්‍රසාද දීමනා ගෙවීම් කල හැකිය.

| අනු අංකය | ආයතනයේ වර්ගය | යෝජිත ප්‍රසාද දීමනාව රු. |
|---|---|---|
| 01 | පෙර වර්ෂයේ අලාභදායී තත්ත්වය අදාල මුදල් වර්ෂය තුල ලාභදායී බවට පත් කර ගෙන ඇති ආයතනද ඇතුලත්ව අදාල මුදල් වර්ෂය තුල ලාභ උපයාගෙන ඇති හා පැමිණීම, කාර්ය සාධනය හෝ වෙනත් පදනමක් මත **<u>දිරිකාරක ගෙවනු නොලබන හෝ නොගෙවූ</u>** පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතන . | 15,000.00 |
| 02 | පෙර වර්ෂයේ අලාභදායී තත්ත්වය අදාල මුදල් වර්ෂය තුල ලාභදායී බවට පත් කර ගෙන ඇති ආයතනද ඇතුලත්ව අදාල මුදල් වර්ෂය තුල ලාභ උපයාගෙන ඇති හා පැමිණීම, කාර්ය සාධනය හෝ වෙනත් පදනමක් මත **<u>දිරිකාරක ගෙවනු ලබන හෝ ගෙවනු ලැබ ඇති</u>** පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතන . | 13,500.00 |

| | | |
|---|---|---|
| 03 | අදාල මුදල් වර්ෂය තුල අලාභ තත්වයක් වාර්තා කර ඇති, එහෙත් පසුගිය මුදල් වර්ෂයට සාපේක්ෂව එම අලාභදායී බව අඩුකරගෙන ඇති පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතන . | 5,000.00 |
| 04 | අදාල මුදල් වර්ෂය තුල අලාභ තත්වයක් වාර්තා කර ඇති හා එම අලාභදායී බව පූර්ව මුදල් වර්ෂයට සාපේක්ෂව අඩුකර ගැනිමට අපොහොසත් වූ පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතන, එවැනි ආයතනවල සේවය කරන සේවකයින් කෙරෙහි සානුකම්පිතව සලකා බලා . | 3,000.00 |

02. ප්‍රධාන ලේකම්ගේ එකඟත්වය.

අදාල මුදල් වර්ෂය තුල අලාභදායී තත්වයක් වාර්තාකර ඇති පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතන කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනාව ගෙවීමට ප්‍රථමයෙන් ප්‍රධාන ලේකම්ගෙන් එකඟතාව ලබා ගත යුතුය. මේ සඳහා අදාල අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය සමඟ ඉදිරිපත් කල යුතුය.

03. අනුගමනය කල යුතු පිළිවෙල

3.1 ප්‍රසාද දීමනාවක් සේ සලකනු ලැබිය හැකි අර්ධ වාර්ෂික දීමනාවක් කිසියම් ආයතනයක් විසින් සියකාර්ය මණ්ඩලයට ගෙවා ඇති විටක, එම ගෙවීම අතිරේක ප්‍රසාද දීමනාවක් ලෙස සැලකීමට ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ඇත්නම් මිස, එය වසර අවසානයේ ගෙවනු ලබන වාර්ෂික ප්‍රසාද දීමනාවේ අත්තිකාරමක් සේ සැලකිය යුතුය.

3.2 මෙම චක්‍රලේඛය මත පදනම්ව වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ පාලක සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

3.3 ඉහත ප්‍රසාද දීමනා ගෙවීම සඳහා, අදාල පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතනවල වාර්ෂික ගිණුම් නියමිත දිනට හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබ තිබිය යුතු අතර, රජය විසින් නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සම්බන්ධයෙන් උපදෙස් හා මාර්ගෝපදේශ නිසි පරිදි පිළිපැද තිබිය යුතුය.

04. විශේෂ කරුණු

4.1 ප්‍රසාද දීමනා ගෙවීම සඳහා මුදල් පළාත් භාණ්ඩාගාරය විසින් සපයනු නොලැබේ.

4.2 සාමූහික ගිවිසුම් හෝ ඒ හා සමාන අවබෝධතා ගිවිසුම් මඟින් වැටුප් හා දීමනා ක්‍රියාත්මක කරන පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතනවලට මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාල නොවේ.

4.3 ඉකුත් වර්ෂවලදී සාමාන්‍ය පටිපාටියෙන් බැහැරව ප්‍රසාද දීමනා ගෙවීමට අනුමැතිය ලබා ගත් සහ මෙම වසරේදී ද එකී පරිපාටියම අනුගමනය කිරීමට අදහස් කරන ආයතන 2017 වර්ෂය වෙනුවෙන් එසේ ප්‍රසාද දීමනා ගෙවීම සඳහා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

4.4 මෙම චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව එක් එක් ආයතන විසින් ප්‍රසාද දීමනා ගෙවීමට අදාලව පසුගිය වසර තුල අනුගමනය කරන ලද පරිපාලන ක්‍රමවේදය පදනම් කරමින් මෙම වසරේද ප්‍රසාද දීමනා ගෙවිය හැකිය.

4.5 ප්‍රසාද දීමනා ගෙවනු ලබන,පළාත් සභා අධිකාරි/ ව්‍යවස්ථාපිත ආයතන විසින් සේවක අර්ථ සාධක අරමුදල්, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල්, පාරිතෝෂික හා උපයන විට බදු ගෙවීම් සියල්ල අදාල අණ පණත් අනුව ගෙවීමට සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය හා ප්‍රධාන විධායක නිලධාරීන් බැඳී ඇති බැවින් ප්‍රසාද දීමනා ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඉල්ලනු ලබන අවස්ථාවේ පවත්නා තත්වය පිළිබඳ වාර්තා කිරීමටත් වග බලා ගත යුතුය.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්, පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් .
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත්: i. ආණ්ඩුකාර ලේකම් (බ.ප.)
ii. විගණකාධිපති.
iii. සියළු නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් (බ.ප.)
iv. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) (බ.ප.)
v. තොරතුරු තාක්ෂණ නිලධාරී